ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

පුවත්පත් නිවේදනය

## ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍යතුමා සහ ඉන්දීය මහ කොමසාරිස්තුමා එක්ව ශ්‍රී ලංකාවේ ප්‍රථම වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාව විවෘත කරයි

ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා මහින්ද්‍රා අයිඩියල් (පුද්.) සමාගම විසින් මතුගම ප්‍රදේශයේ ඉදිකරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රථම වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාව 2019 අගෝස්තු මස 17 වන දින විවෘත කරන ලදී. මහින්ද්‍රා අයිඩියල් ලංකා (පුද්.) සමාගම ඉන්දියාවේ මහින්ද්‍රා සහ මහින්ද්‍රා සමාගමේ සහ ශ්‍රී ලංකාවේ අයිඩියල් මෝටර්ස් සමාගම අතර බද්ධ ව්‍යාපාරයක් වේ.

අග්‍රාමාත්‍ය උපදේශක චරිත රත්වත්තේ මහතා , ආයෝජන මණ්ඩලයේ සභාපති මංගල යාපා මහතා, ශ්‍රී ලංකා රජයේ නිලධාරීන්, අයිඩියල් සමූහ ව්‍යාපාරයේ සභාපති නලින් වෙල්ගම මහතා සහ මහින්ද්‍රා සහ මහින්ද්‍රා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ ආචාර්ය පවන් ගොඑන්කා මහතා සහ තවත් සම්භාවනීය අමුත්තන් රැසක් මෙම මෙම අවස්ථාවට සහභාගී වූහ.

ඉන්දීය සහ ශ්‍රී ලංකා සමාගම් අතර සමානතා පවතින බව පෙන්වා දුන් අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා දෙරට අතර කාර්මික ක්ෂේත්‍රයේ සහයෝගීතාවය වර්ධනය කරගැනීම සඳහා අවස්ථාවන් රැසක් පවතින බව සඳහන් කළේය. එසේම, එතුමා ශ්‍රී ලංකාව කෙරෙහි තබන ලද විශ්වාසයට සහ ශ්‍රී ලංකාවට ලබා දෙන සහයෝගයට ඉන්දීය නායකත්වයට සිය ස්තූතිය පළ කළේය.

ඉන්දියා - ශ්‍රී ලංකා බද්ධ ව්‍යාපාරයක් විසින් කළුතර ඉදිකරන ලද මෙම නවීන කර්මාන්තශාලාව තුළින් දෙරටට එක්ව ළඟා කරගත හැකි දේ පිළිඹිබු වන බව මහ කොමසාරිස්තුමා පෙන්වා දුන්නේය. “Make in Sri Lanka” සහ “Make in India” යන්න ප්‍රවර්ධනය කිරීම මෙම කර්මාන්තශාලාවෙන් සංකේතවත් වන බවද එතුමා සඳහන් කළේය. එසේම, අසීරු අවස්ථාවන්හිදී ශ්‍රී ලංකාවට ශක්තියක් වීමට ඉන්දීය සමාගම් දක්වන කැපවීමද මෙම කර්මාන්තශාලාව තුළින් පෙන්නුම් කෙරෙන බව එතුමා ප්‍රකාශ කළේය.

මෙම කර්මාන්තශාලාව ප්‍රධාන වශයෙන්ම දේශීය ඉල්ලුම සපුරාලීමට අපේක්ෂා කරයි. එතුළින් දේශීය රැකියා ජනනය වන අතර ආයෝජන, නව්‍ය තාක්ෂණ ක්‍රමවේද සහ කුසලතා ගෙන එයි. එසේම, එය සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේම වර්ධනයට දායකත්වය ලබා දෙයි.

*****

කොළඹ
2019 අගෝස්තු 19